**ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශිර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දී මෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.<br>2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි කටයුතු නොකිරීම<br>3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම<br>4. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.1<br>2.2.1<br>2.11<br>2.1.2 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |

| | | | |
|---|---|---|---|
| | අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදි පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | අනුකූල නොවීම් | 2.12 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.8 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. කළමනාකරණ දුර්වලතා<br>2. අවිධිමත් ගනුදෙනු | 2.6<br>2.4 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඟ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | 1. වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම.<br>2. මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.3 (අ)<br>2.15 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණය

## 2.1 කාර්යසාධනය

### 2.1.1 සැලැසුම් කිරීම

2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. එසේවුවද පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම සමඟ (Imprest Requirement Plan) ඉදිරිපත් කර නොතිබුණි .

**2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**----------------------------------**

**අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**--------------------------------------------**

කෞතුකාගාර දෙපාර්තමේන්තුවට ජල ටැංකියක් ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ මුදල වූ රු.19,031,511 ක් 2016 වර්ෂයේ දී ඉංජිනේරු සංස්ථාවට ගෙවා තිබුණද 2017 මැයි මාසයේ නිම කිරීම අවසන් කළ යුතු ජල ටැංකිය ඉදිකිරීමේ කාර්යය 2018 අගෝස්තු මස වන විටද අවසන් කර නොතිබුණි.

**2.1.3 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

**----------------------------------------------**

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සූදානම් වීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කළ බවට සාක්ෂි නොතිබුණි.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

**------------------------------------------------------------**

**2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

**--------------------------------**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 51.8 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 49.5ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.

**2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2017 පුහුණු වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.9(ආ) මාර්ගෝපදේශයෙන් බැහැරව රු.540,000 ක මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ආරම්භ කර තිබූ ගිනි නිවීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව ගිවිසුම්ගත වටිනාකම රු.19,867,214 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ කාර්යය සාධන සුරක්ෂණයෙහි කාලය 2017 ජනවාරි 19 දිනෙන් අවසන්ව තිබුණි. 2018 ජූලි 30 දින දක්වාම කොන්ත්‍රාත්තුව නිම වී නොමැති බැවින් එම කාලය ආවරණය වන පරිදි කාර්යය සාධන සුරක්ෂණයෙහි කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ගිනි නිවීමේ පද්ධතියේ උපදේශක ආයතනය වශයෙන් කටයුතු කර තිබූ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයට රු.2,498,942 ක් ගෙවා තිබුණි. එසේ වුවද කාර්යාංශය විසින් සැලැසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමේදී ගිනි නිවීමේ පද්ධතියට ජලය හා විදුලිය සැපයීම පිළිබඳව අවධානය යොමු නොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය 2018 අගෝස්තු වන විටත් අවසන් කිරීමට නොහැකිව තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දින වන විට ගිනි නිවීමේ පද්ධතිය සඳහා ජල ටැංකියක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තා සැලකිල්ලට නොගෙන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.19,031,510 ක් වූ සම්පූර්ණ මුදලම ගෙවීමට කටයුතු කර තිබුණි. උප කොන්ත්‍රාත්තු පැවරීම හේතුවෙන් 2018 අගෝස්තු වන විටත් කාර්යය නිම කර නොතිබීම නිසා ගිනි ආරක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහන උපයෝජනය

දෙපාර්තමේන්තුව සතුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 07 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 61,712 ක් ධාවනය කර තිබුණු අතර, ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.801,636 ක් ද, වාහන සේවා කිරීම සඳහා රු.165,884 ක් ද, වාහන අළුත්වැඩියා සඳහා රු.1,063,447 ක් ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු.238,711 ක් ද වශයෙන් එකතුව රු.2,580,668 ක් වැය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝමීටරයක් සඳහා රු. 42 ක් වැය කර තිබුණි.

### (ආ) වත්කම් වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම

කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයත් වර්ග අඩි 8000 ක් පමණ වූ පැරණි ආපනශාලා ගොඩනැගිල්ල බදු දීම.

(i) හස්ත කර්මාන්ත මණ්ඩලයට තෑගි සහ සැමරුම් භාණ්ඩ අලෙවිසැලක් පවත්වා ගැනීම සඳහා කුලී පදනම මත ලබා දීමේදී 2011 අගෝස්තු සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ලැබී තිබූ බදු කුලිය රු.2,314,683 ක් විය. එසේ වුවද 2017 වර්ෂයේදී රජයේ තක්සේරුකරු විසින් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගෙවිය යුතු බදු කුලිය රු.51,303,000 ක් ලෙස තක්සේරු කර තිබීම හේතුවෙන් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඩුවෙන් අයකර තිබූ බදු කුලිය රු.48,988,317 ක් විය.

(ii) තවද හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 500 ක පමණ ප්‍රමාණයක් බීම සහ ආහාරපාන වෙළඳසැලක් පවත්වා ගෙන යාම සඳහා පෞද්ගලික ආයතනයකට මාසිකව රු. 100,000 ක් සහ එම ආයතනයේ වැඩිවන පිරිවැටුම මත සියයට 7.5 ක සිට සියයට 25 ක් දක්වා වූ කුලියකට අතුරු බදු දී තිබුණි. රජයේ තක්සේරුගේ වාර්තාවට අනුව 2013 අගෝස්තු සිට 2017 දෙසැම්බර් දක්වා එම කොටසේ කුලිය රු.4,134,000 ක් විය. කෞතුකාගාර දෙපාර්තමේන්තුව අතුරු බදුකරු ඉවත් කිරීමට හෝ අතුරු බද්ද නිත්‍යානුකූල කිරීමට පියවර ගෙන නොතිබුණි. මෙම ආපනශාලාව රාත්‍රී 9.00 දක්වා විවෘතව තැබීම නිසා බාහිර පුද්ගලයන්ට කෞතුකාගාර පරිශ්‍රයට ඇතුලුවීමට අවස්ථා පැවතීම කෞතුකාගාරයේ ආරක්ෂාවටද තර්ජනයක් වී ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

**(ඈ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කෞතුකාගාරයේ වඩුමඩුව පිහිටි මායිම් ප්‍රදේශය තුළ බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් ඉදිකරනු ලැබූ තාවකාලික ගොඩනැගිල්ලක් පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම ගොඩනැගිල්ල ඉවත් කිරීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) කෞතුකාගාර භූමියේ පවත්වාගෙන යන උප තැපැල් කාර්යාලය සඳහා කිසිඳු තක්සේරුවක් සිදු නොකර මාසිකව රු.375 ක් පමණක් අයකිරීමේ පදනම මත දිගු කාලයක සිට පුද්ගලයකුට ලබා දී තිබූ අතර, මේ සඳහා ලැබිය යුතු ආදායම් නියමිත පරිදි ලබා නොගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රජයේ තක්සේරුව ලබාගෙන කාලීනව කුලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 අවිධිමත් ගනුදෙනු

**-------------------**

දෙපාර්තමේන්තුවෙන් පවත්වා ගෙන යන ආපන ශාලාවේ විදුලි පරිභෝජනය ගණනය කිරීමට මනුවක් සවිනොකර විදුලිය සීමාවකින් තොරව පරිභෝජනයට ඉඩ හැරීම හේතුවෙන් 2015 වර්ෂයේදී ආපන ශාලාව පවත්වාගෙන ගිය අයගෙන් රු.107,646 ක මුදලක් අයකර ගැනීමට තීරණය කර තිබුණද ආපනශාලාව බදු දීම සම්බන්ධයෙන් ගිවිසුමක් නොමැති වීම නිසා එම මුදල ද ගෙන අයකර නොතිබුණි.

## 2.5 විසඳා නොතිබුණු විගණන ඡේද

**----------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

**විගණකාධිපති වාර්තාවට යොමුගත විෂයය**
**යොමුව**

| **වර්ෂය** | **ඡේද අංකය** | |
|---|---|---|
| 2016 | 3.4 (ආ) | වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |
| | 3.5 (ආ) | රත්නපුර කෞතුකාගාරයේ වැසිකිළි පද්ධතිය |
| | 3.8 (අ) | කොළඹ කෞතුකාගාරයේ සිදු වූ කෞතුක භාණ්ඩ සොරකම |
| | 3.8 (ආ) | රත්නපුර කෞතුකාගාර අධිකාරි නිල නිවාස 2013 වර්ෂයේ සිට අලුත්වැඩියා නොකිරීම |
| | 3.8(ඌ) | කෞතුකාගාර ප්‍රකාශන අංශයේ මුද්‍රණය කරන පොත් වෙනුවෙන් ජාත්‍යන්තර පිළිගත් ක්‍රමවේදය වෙනුවෙන් ISBN අංක ලබා නොගැනීම. |
| | 3.9 (ආ) | රත්නපුර කෞතුකාගාරයේ අලුත්වැඩියා කටයුතු |
| | 3.9 (ඇ) | කොළඹ කෞතුකාගාරයේ ආරක්ෂිත කැමරා (CCTV) පද්ධතියේ උපස්ථක (Backup) පවත්වාගෙන යනු ලබන්නේ සර්වර් (Server) එක සමග එක් ස්ථානයක පමණක් වන අතර මෙම ස්ථානයේ ගිනි නිවන උපකරණ ද සවිකර නොතිබීම |
| | 3.9 (ඉ) | කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන නරඹන්නන්ට ප්‍රමාණවත් අවම පහසුකම් හෝ සපුරා තිබූ ආපන ශාලාවක් නොමැති වීම |

## 2.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1942 අංක 31 දරන ජාතික කෞතුකාගාර ආඥා පනත පරිච්ඡින්න කර ශ්‍රී ලංකාවේ වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන්ට අනුරූප වන අයුරින් නව පනතක් නිර්මාණය කිරීමේ අරමුණින් 2014 අගෝස්තු 29 දිනැති අංක 14 / 1269/ 555/010 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි. එය සාකච්ඡා කිරීමෙන් පසු ලබාදෙන ලද නියමයන්ට අනුව නීති කෙටුම්පත් සම්පාදක ලවා සංශෝධන සිදුකර 2015 ජූලි 07 දින වන විට අවසන් කර තිබුණි. 2018 අගෝස්තු මාසය වන විටත් නව පනත සම්මත කර ගැනීමේ කාර්යභාරය අවසන් නොවීම හේතුවෙන්, වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු පමා වී තිබුණි.

(ආ) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන විසින් තම ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතුයි. එසේ වුවද මේ පිළිබඳ දෙපාර්තමේන්තුව දැනුවත්ව නොතිබුණු බැවින් රාජ්‍ය ආයතනයක් වෙතින් සේවාවන් ලබන මහජනතාවගේ අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව, ගුණාත්මකව හා අඛණ්ඩව ඉටුකරන බවට ලිඛිත බැඳීමක් ආකාරයෙන් ස්ථාපිත කළ යුතු පුරවැසි- සේවාලාභී ප්‍රඥප්තිය ස්ථාපිත කර නොතිබුණි.

(ඇ) 2016 නොවැම්බර් 22 දින අනතුරකට ලක් වූ WPCAD - 1559 දරන මෝටර් රථය අළුත්වැඩියා කටයුතු සඳහා දේශීය නියෝජිත ආයතනය රු.5,795,096 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද පසුව පුද්ගලික ආයතනයක් මගින් රු.505,464 ක ඇස්තමේන්තුවක් ලබාගෙන එම ආයතනයට අලුත්වැඩියාව සඳහා ලබා දී වර්ෂ 1 ½ පමණ ගත වුවද, මෙම ප්‍රමාදයට හේතු වූ කරුණු සොයා නොලැබීම හේතුවෙන් 2018 අගෝස්තු 15 වන විටත් අලුත්වැඩියා කටයුතු අවසන් කර රථය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කොළඹ කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර ඇති නමුත් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර, මහනුවර හා රත්නපුර ප්‍රාදේශීය කෞතුකාගාරවල කෞතුක භාණ්ඩ සමීක්ෂණය 2018 අගෝස්තු වනවිටත් සම්පූර්ණ කර නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් මාසයේ දී ප්‍රදර්ශන පුවරු (Display Panels) ධූම ආවරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 137(5) විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ ලබා ගෙන නොතිබියදී නාමමාත්‍ර ඉන්වොයිසි (Proforma Invoice) මත අවස්ථා 8 කදී රු.6,152,931 ක් ගෙවීම් කර තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් මාසයේ ගෙවීම් ලෙස දක්වා තිබූ කොන්ත්‍රාත් හා සැපයුම්කරුවන් වෙත ලියන ලද එකතුව රු.31,647,312 ක්වූ චෙක්පත් 07 ක් 2018 මැයි මස 03 දිනයේදී ද ප්‍රධාන ගණකාධිකාරී භාරයේ පැවතුණි.

**2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්ථන | 112.77 | 105.92 | 6.85 | 6.07 |
| | මූලධන | 92.40 | 45.30 | 47.10 | 50.97 |
| | **එකතුව** | **205.17** | **151.22** | **53.95** | **26.30** |
| 2014 | පුනරාවර්ථන | 125.93 | 125.54 | 0.39 | 0.31 |
| | මූලධන | 127.05 | 120.50 | 6.55 | 5.16 |
| | **එකතුව** | **252.98** | **246.04** | **6.94** | **2.74** |
| 2015 | පුනරාවර්ථන | 161.44 | 149.85 | 11.59 | 7.18 |
| | මූලධන | 147.86 | 118.39 | 29.47 | 19.93 |
| | **එකතුව** | **309.30** | **268.24** | **41.06** | **13.28** |
| 2016 | පුනරාවර්ථන | 159.87 | 157.85 | 2.02 | 1.26 |
| | මූලධන | 177.92 | 175.91 | 2.01 | 1.13 |
| | **එකතුව** | **337.79** | **333.76** | **4.03** | **1.19** |
| 2017 | පුනරාවර්ථන | 186.96 | 184.90 | 2.06 | 1.10 |
| | මූලධන | 96.91 | 67.48 | 29.43 | 30.37 |
| | **එකතුව** | **283.87** | **252.38** | **31.49** | **11.09** |

**2.8** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

-------------------------------------------------

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 20801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15 | 14.8 | 8. | 9.5 | 49 | 36.7 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

----------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.1,779,843 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 23 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**2.9** **අග්‍රිම ගිණුම**

--------------

දෙපාර්තමේන්තු පොත් අනුව 2017 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමෙහි ශේෂය රු.50,524 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය රු.113,587 ක් වූයෙන් රු.63,063 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

**2.10** **බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**ගැලපුම් කළයුතු ශේෂ**

------------------------

දෙපාර්තමේන්තු බැංකු ගිණුමට අදාළව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු. 1,864,058 ක් වටිනා චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම්වල වටිනාකම රු.266,761 ක් සම්බන්ධයෙන් එම ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) හානි පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (i) | පවත්වා නොතිබුණි. |

**2.12 අනුකූල නොවීම්**

**2.12.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 260, 389 (අ) ප්‍රකාර නියමිත තැනැත්තාට මුදල් ගෙවීම් කළ යුතු වන අතර, එහිදී ගෙවීම් ලබන අයගේ අනන්‍යතාවය තහවුරු කළ හැකි පරිදි අදාළ තොරතුරු ලබා ගත යුතුයි. එසේ වුවද වටිනාකම රු.4,300,357 ක චෙක්පත් භාරදීමේදී අදාළ ලේඛනයේ චෙක්පත් භාර දුන් දිනය හා එම චෙක්පත් භාරගත් අයගේ අනන්‍යතාවය තහවුරු කිරීමට අවශ්‍ය විස්තර දක්වා නොතිබුණි.

**2.12.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව 2017 වර්ෂයට අදාළව VAT (එකතු කළ අගය මත බද්ද) බදු ආවරණය සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර එකී ගෙවීම් පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත දැනුම් දීමට කටයුතු කර නොතිබුණි.

**2.13 අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 ට අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා අභ්‍යන්තර විගණකවරයෙක් හා කාර්යමණ්ඩලය සඳහා එක් නිලධාරියෙක් පමණක් පත්කර තිබුණද ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පත් කර නොතිබුණු නිසා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

**2.14** **මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තුමේන්තුවේ කාර්යයභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 142.7 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 443,168 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 7 | 8 |
| (ii) | තෘතියික මට්ටම | 4 | 2 | 2 |
| (iii) | ද්විතියික මට්ටම | 123 | 70 | 53 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 258 | 243 | 15 |
| | **එකතුව** | **400** | **322** | **78** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ පහත සඳහන් කාර්යය මණ්ඩල පුරප්පාඩු පැවතීම නිසා කාර්යයසාධනය පහත වැටීමට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

(i) කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සිටිය යුතු ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ද්විතියික මට්ටමේ නිලධාරී සංඛ්‍යාව 142 ක් වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට ඉන් තනතුරු 63 ක්ම පුරප්පාඩුව පැවතීම.

(ii) සංරක්ෂණ සහකාර සත්ත්ව විද්‍යා සහකාර ඇතුළුව දෙපාර්තමේන්තු අනුමත තනතුරු 9 න් තනතුරු 08 ක් දැනට පුරප්පාඩුව පැවතීම.

(ආ) කොළඹ කෞතුකාගාරයේ 2012 මාර්තු මස සිදු වූ කෞතුක භාණ්ඩ සොරකම සහ 2014 නොවැම්බර් මස සිදු වූ අනවසර ඇතුළු වීම වැනි සිදු වීම් මත කෞතුකාගාරයේ ආරක්ෂාව පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතුයි. එසේ වුවද ආරක්ෂක නිලධාරී තනතුරු 8 න් 7 ක් එනම් ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුරද, ආරක්ෂක සහකාර තනතුරු 5 ක් හා සහකාර මුර පරීක්ෂක තනතුරද පුරප්පාඩුව පවතින නමුත් එම පුරප්පාඩු පිරවීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුමත කාර්යය මණ්ඩලයට තාක්ෂණ නිළධාරීන් දෙදෙනෙකු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරක් හා තොරතුරු තාක්ෂණ සහකාර තනතුරක් ද ඇතුළත් වුවද එම තනතුරු 4 ම පුරප්පාඩුව තිබීම හේතුවෙන් ආරක්ෂිත කැමරා පද්ධතියේ තාක්ෂණික කටයුතු එය ස්ථාපනය කළ සමාගමේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පවත්වා ගැනීමට සිදු වී තිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ගේ ප්‍රමුඛස්ථානය ලෙසට විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ වන්නා වූ වස්තූන් හා ආදර්ශ රැස් කිරීම, ලේඛනාරූඪ කිරීම දක්වා තිබුණි. මෙම කාර්යය සඳහා සහයදීමේ කාර්යයමණ්ඩලය යටතට ගැනේ. කීට විද්‍යා සහකාර, උද්භිත විද්‍යා සහකාර, භූ විද්‍යා සහකාර, මානව විද්‍යා සහකාර හා සත්ත්ව විද්‍යා සහකාර යන තනතුරු සියල්ලම පුරප්පාඩු වී තිබීම ඉහත කාර්යය ඉටු කිරීමේදී බාධාවක් වී ඇති බව නිරීක්ෂණය විය.

**2.15 රජයේ නිලධාරීන්ට ඇප තැබීම.**

මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධි විධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.